**විසර්ජන ශීර්ෂය - 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වු දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,509,829,395 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,112,572,657 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.197,851,110 ත් රු.200,071,628 දක්වා වු පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත 37 ත් අතර පරාසයක පැවතිණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදන | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජන | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 420,160,000 | 555,300,000 | 378,078,867 | 400,196,023 | 42,081,133 | 155,103,977 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 186,250,000 | 348,119,395 | 176,581,716 | 157,716,051 | 9,668,284 | 190,403,344 |
| | එකතුව | 606,410,000 | 903,419,395 | 554,660,583 | 557,912,074 | 51,749,417 | 345,507,321 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 106 | 10601 | 4,200,000 | 1,288,40 | 2,500,000 | 3,117,529 | 16,000,000 | 9,079,147 |
| 304 | 30401 | 15,000,000 | 3,572,989 | 5,500,000 | 8,301,283 | 60,000,000 | 31,441,436 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් වල ශේෂවල එකතුව රු.19,765,272 ක් වු අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 15/20 | 14,418,188 |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0159/000 | 5,347,084 |

# 11 කොටස

-----------

## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

-----------------------------------------------------------

## 1. විසර්ජන ශීර්ෂය - 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

----------------------------------------------------------------

### 1.1 විගණන විෂය පථය

---------------------

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිර්ක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා වූ ඡේද වල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) අමාත්‍යංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| වාහන අනතුරු ලේඛනය | මු.රෙ. 110 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය |

**( ආ ) අයවැය විචලනය**

( i ) වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.6,200,000 ක් වු සම්පූර්ණ මූලධන ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

( ii ) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීමේ හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 81 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් , දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ් / ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් , එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.4.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

ඉහත (1.4.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල

කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණු අතර 2012 පෙබරවාරි 02 දින මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය වන පරිදි ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කර තිබුණි.

### 1.4.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා

-------------------------------

ඉහත (1.4.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණු අතර එය පිළියෙල කර තිබුණේ 2012 පෙබරවාරි 02 දිනය.

### 1.4.5 අභ්‍යන්තර විගණනය

----------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද 2012 ජුනි මාසයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකුගේ පුරප්පාඩුව පැවතිණි. එසේම ඉදිරිපත් කරන ලද විගණන සැලැස්මට අනුකූලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 1.4.6 අභ්‍යන්තර විගණන කමිටු ක්‍රියාත්මක කිරීම

----------------------------------------------

මාස 03 කට වරක්වත් විගණන කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත් 2012 වසරේදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| ( i ) | මුදල් රෙගුලාසි | | |
| | මු.රෙ. 104 | 2,194,794 | සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයට අයත් වාහන 05 ක් අනතුරට පත්වී ඇතත් ප්‍රාරම්භක වාර්තාවන් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | මු.රෙ. 110 | | වාහන අනතුරු ලේඛණයක් පවත්වා ගෙන නොතිබුණි. |
| | මු.රෙ. 1646 | | වාහනවල දෛනික ධාවන සටහන් පත් සැම මාසයක වෙනුවෙන්ම ඊට පසුව එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| | මු.රෙ. 1647 | | වාහනද ඒවායේ උපකරණ පිළිබඳවද සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව පැවැත්විය යුතු වුවත්, එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>------------------------<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | 296,474,533 | ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>---------------------------<br>1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41 / 90 දරන චක්‍රලේඛය | | චක්‍රලේඛ විධිවිධාන පරිදි සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

**1.7 අවිධිමත් ගනුදෙනු**

--------------------

( i ) 2012 වර්ෂය සඳහා ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන වාර්තාව අනුව ආපදා සහන ප්‍රතිපාදන රු.189,215,259 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 කට ආපදා සහන සේවා වශයෙන් ලබාදී තිබුණු අතර එම මුදල් වියදම් කරන ලද ආකාරය පිළිබඳව දැක්වෙන වියදම් විස්තර වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii ) නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැළසීම සඳහා ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 කට ජල ටැංකි මිළදී ගැනීමට 2012 වර්ෂයේදී රු.19,520,844 ක් ලබාදී තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 04 ක මිළදී ගත් ජල ටැංකි ප්‍රමාණය හා ඒ සඳහා දරන ලද වියදම වු රු.6,160,000 ක් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 13 | 06 |
| ii. | තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| iii. | ද්විතියක මට්ටම | 442 | 216 | 226 |
| iv. | ප්‍රාථමික මට්ටම | 47 | 31 | 16 |
| | එකතුව | 513 | 262 | 251 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 251 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**විසර්ජන ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

## 2.1 විගණන විෂය පථය

--------------------

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 අගෝස්තු 22 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පලිබඳ විගණන නිරීක්ෂණ

--------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවල නිරීක්ෂණය විය.

| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| වාහන අනතුරු ලේඛනය | මු.රෙ. 110 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය |

( ආ ) අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීමේ හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 57 සිට සියයට 83 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

( ඇ ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 30401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.244,246 ක් වු අතර , එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් , දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ් / ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත

සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත , එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

2.4.2 **වාර්ෂික කාර්ය සාධන වාර්තා**

-------------------------------

ඉහත (2.4.1) හි සදහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජුල 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.4.3 **අභ්‍යන්තර විගණනය**

---------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.

2.4.4 **විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් විගණන කළමනාකරණ කමිටු නොපැවැත්වේ.

2.5 **වත්කම් කළමනාකරණය**

-------------------------

**නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

පහත විග්‍රහ කර ඇති පරිදි සමහරක් වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | **වත්කම් වර්ගය** | **ඒකක ගණන** | **නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය** |
|---|---|---|---|
| (i) | වාහන | 01 | වර්ෂ 03 ට වැඩි |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | 06 | වර්ෂ 03 ට වැඩි |

(iii) යන්ත්‍ර සූත්‍ර 01 වර්ෂ 08 ට වැඩි

## 2.6 අනුකූල නොවීම්

------------------

### (අ) නීති , රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ---------------------------------- | ----------- | ---------------- |
| | රු. | |
| **(i) ආයතන සංග්‍රහය** | | |
| ------------------- | | |
| ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4, 4.2.5 4.4.1 සහ 4.5 වගන්ති | 234,746 | විශ්‍රාම ගිය, මියගිය, සේවය හැර ගිය රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්ව නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii) මුදල් රෙගුලාසි** | | |
| ---------------- | | |
| මු.රෙ. 1646 | | මුදල් රෙගුලාසිය ප්‍රකාර දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සෑම මසකම 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |
| මු.රෙ. 1647 | | වාහනද ඒවායේ උපකරණ පිළිබඳවද සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව පැවැත්විය යුතු වුවත්, එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| **(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| -------------------------- | | |
| 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛයේ 3(IV ) ඡේදය | | නිලධාරීන්ට වෙන්කළ නිල වාහන සඳහා චක්‍රලේඛය පරිදි සටහනක් පවත්වාගත යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |

(iv) **භාණ්ඩාගාර චක්‍රලේඛ**

------------------------

| | | |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | 642,638,486 | ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර නොතිබුණි. |

(v ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

---------------------

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

2.7 **කාර්ය සාධනය**

----------------

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

( i ) නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ට කාලගුණික තොරතුරු ලබාගැනීම සහ එම තොරතුරු විවිධ ජාල ඔස්සේ අදාල තාක්ෂණික අංශ වෙත යැවීමේ හැකියාවන්ගෙන් යුක්තවූ ඩොප්ලර් රේඩාර් පද්ධතියක් මිළදී ගැනීම සඳහා රු.මිලියන 320 ක් ද එය සවිකිරීමේ කටයුතු වෙනුවෙන් රු.මිලියන 374 ක් ද වියදම් කර තිබුණි. මෙම රේඩාර් පද්ධතිය 2012 අගෝස්තු මාසයේදී දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු අතර, 2013 ජූලි 30 දින වනවිටත් සවිකිරීමේ කටයුතු අවසාන කර යන්ත්‍රය ක්‍රියාත්මක කර කාලගණික දත්ත ලබාදීමට අපොහොසත්වී තිබුණි.

(ii ) ත්‍රිකුණාමළයේ සිවිල් ප්‍රදේශය තුල කාලගුණ විද්‍යා කාර්යාලයක් ස්ථාපනය කිරීම සඳහා ඉඩමක් පවරා ගැනීමේ කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර රු.මිලියන 10.82 ක පිරිවැයකින් 2012 වසරේදී ගොඩනැගිල්ල නිමකිරීම සැලසුම් කර තිබුණද, මේ වනතුරු ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2012 වර්ෂයට අදාලව රු.මී.3 ක ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද, ඉදිකිරීම සම්බන්ධ ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

(iii ) දෙපාර්තමේන්තුව යටතේ අයත් වර්ෂාමාන මධ්‍යස්ථාන 555 ක් දිවයින පුරා විසිර පවතින අතර 2012 වර්ෂය තුළදී උසස්ත්‍රිකයන් 17 ක ස්ථානගත වී ඇති වර්ෂාමාන මධ්‍යස්ථාන 35 කින් වර්ෂාමාන දත්ත ලැබී නොතිබුණු බව එම ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

## 2.8 පාඩු හා හානි

----------------

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ පාඩු පිළිබඳ ප්‍රකාශයේ රු.25,000 ට වැඩි වර්ෂ 10 වඩා වැඩිවූ හානි සිද්ධි 03 ක වටිනාකම රු.1,036,086 ක් වී තිබුණි. 2013 වර්ෂය වනවිට රු.25,000 ට වඩා වැඩි වර්ෂ 09 කට වඩා වැඩි වූ හානි සිද්ධි 5 ක වටිනාකම රු.3,395,926 ක් විය.මෙම අලාභ සම්බන්ධව මු. රෙ. පරිදි කටයුතු කරමින් පවතී.

## 2.9 කළමනාකරණ දුර්වලතා

--------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තා වල ඇතුලත්ව තිබුණු විගණන ඡේද රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් කරනු ලැබූ නිර්දේශ බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | | යොමුගත විෂයය | රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේ දිනය | සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | | | |
| 2010 | (i) | 2.6(අ) | අකුණු අනාවරණ පද්ධතිය සහ ඩොප්ලර් රේඩාර් පද්ධතිය ඉක්මනින් ස්ථාපනය කිරීම | 2011.06.08 | 2007 වර්ෂයේ සිට අකුණු අනාවරණ පද්ධතිය සහ ඩොප්ලර් රේඩාර් පද්ධතිය අප්‍රමාදව ස්ථාපනය කිරීමට කටයුතු කිරීම |
| | (ii) | 2.7 | පාඩු හා හානි | | භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගෙන පාඩු හා හානි කපා හැරීමට කටයුතු කිරීම |

## 2.10 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

--------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 32 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 29 | 03 | 26 |
| (iii) | ද්විතියක මට්ටම | 238 | 170 | 68 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 140 | 72 | 68 |
| | එකතුව | 459 | 277 | 182 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 182 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.